# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල



| දිනය Date | 2025.05.11 පැය 2220 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/974/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


## පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු

### 01. මනුෂ්‍ය ඝාතනයක් - රිදීමාලියද්ද පොලිස් වසම

2025.05.11 වන අද දින අළුයම් කාලයේ රිදීමාලියද්ද පොලිස් වසමේ ඉහිරිය ප්‍රදේශයේදී පුද්ගලයෙකු පහරදීමක් හේතුවෙන් මියගොස් ඇති බවට රිදීමාලියද්ද පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ පෙතියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තරුණියක් සමඟ ප්‍රේම සම්බන්ධතාවයක් පවත්වාගෙන ගොස් ඇත. එම ප්‍රේම සම්බන්ධතාවයට ඇයගේ පියා විසින් විරුද්ධත්වය ප්‍රකාශ ඇති අතර 2025.05.11 වන අද දින අළුයම් කාලයේ මරණකරු තරුණියගේ නිවසෙහි දොර කඩා ඇතුළුවීමේදී තරුණියගේ පියා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය කර ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහියංගනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වයස අවුරුදු 57 ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර රිදීමාලියද්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයක් - ලිඳුල පොලිස් වසම

2025.05.10 වන දින රාත්‍රී කාලයේ ලිඳුල පොලිස් වසමේ කුම්වුඩ් ප්‍රදේශයේදී පුද්ගලයෙකුට පහරදීම හේතුවෙන් මියගොස් ඇති බවට ලිඳුල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 53 ක් වූ කුම්වුඩ් වත්ත, තලවාකැලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා ඔහුගේ සහෝදරයා අතර බීමත්ව සිටියදී ඇතිවූ ආරවුලක් මත උදැල්ලකින් පහරදී මෙම ඝාතනය සිදුව ඇති බවට විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය නුවරඑළිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වයස අවුරුදු 53ක් වන සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර ලිඳුල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මිනුවන්ගොඩ කඳවුර.**

2025.05.11 වන අද දින අළුයම් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ පොල්වත්ත ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා මිනුවන්ගොඩ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 110 ක් හා හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 700 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන මිනුවන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 28 හා 32 යන වයස්වල පසුවන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද දුම්වැටි සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - අධිවේගී මාර්ග සංචාරක පොලිස් කොට්ඨාසය.**

2025.05.10 වන දින රාත්‍රී කාලයේ පැලියගොඩ පොලිස් වසමේ අධිවේගී අන්තර් හුවමාරුවේදී අධිවේගී මාර්ග සංචාරක පොලිස් කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **තීරුබදු රහිතව මෙරටට රැගෙන එන ලද දුම්වැටි 1800 ක් වෑන් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු වෑන් රථය ද සමඟ** අත්අඩංගුවට ගෙන පැලියගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**එක් සැකකරුවෙකු වයස අවුරුදු 40 ක් වන චීන ජාතිකයෙකු වන අතර අනෙක් සැකකරු වයස අවුරුදු 23 ක් වන කොළඹ 15 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඳාන පොලිස් ස්ථානය.**

2025.05.11 වන දින උදෑසන කාලයේ කඳාන පොලිස් වසමේ තුම්පැළිය ප්‍රදේශයේදී කඳාන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 32 ක් වන ජාඇල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඳාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. දියේ ගිලී පුද්ගලයෙකු මියයාම - සමනලවැව පොලිස් වසම.**

2025.05.11 වන දින දහවල් කාලයේ සමනලවැව පොලිස් වසමේ බෙලිහුල්ඔය දියපහස නැමති ස්ථානයේ දියනාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට සමනලවැව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ ඉඹුල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**
මෘත ශරීරය බලංගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සමනලවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**